**රාජ්‍ය සේවා අර්ප සාධක අරමුදල- 2013**

---

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය) 24(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ , ආදායම් හා වියදම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

# 2. මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 මතය ව්‍යාචනය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අර්ථ සාධක අරමුදල සඳහා සියලුම දායකයන් විසින් ගෙවනු ලැබූ දායක මුදල සහ රජය දායක කොටසේ මුළු එකතුව රු.36,503,985,218 ක මුදල ජංගම නොවන වගකීම් ලෙස දක්වනවා වෙනුවට හිමිකම් ලෙස ශේෂපත්‍රයේ දක්වා තිබුණි.

(ආ) ජංගම වත්කම් වශයෙන් ගැලපුම් ගිණුමේ රු. 8,825,541 ක හඳුනානොගත් හර ශේෂයක් පැවතුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විගණන සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් සතුටුදායක ලෙස ගනුදෙනු නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(අ) අරමුදල වෙනුවෙන් කේවල ගිණුම පවත්වා ගැනීමට කටයුතු කර නොතිබූ හෙයින්, වර්ෂය අවසානයේ අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු.14,401,779,333 ක මුදල පරීක්ෂා කිරීමට නොහැකි විය. මෙයට අතිරේකව අරමුදලට අනිවාර්ය දායක ගෙවීම සිදු කරන දායකයින්ගෙන් ලැබිය යුතු හිඟ ශේෂයන්ද ගණනය කර නොතිබිණි. සමාලෝචිත වර්ෂය තුළ රු.336,105,862 ක දායක මුදල් දායකයින් වෙත ගෙවා තිබූ නමුත් ඉහත තත්ත්වය යටතේ එම ගෙවීම්වල නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) ස්වේච්ඡා දායක මුදල් ගෙවන දායකයින් වෙනුවෙන් කේවල ගිණුම් පවත්වා නොතිබූ බැවින් වර්ෂය අවසානයට ගෙවා ඇති ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ රු.22,536,299 ක ශේෂයේ නිවැරදිතාවය සනාථ කර ගැනීමට නොහැකි විය.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අණ්ඩ පනතේ (621 අධිකාරිය) | |
| (i) 2 (2) වගන්තිය | එක් එක් දායකයා වෙනුවෙන් කේවල ගිණුම් පවත්වා ගත යුතු වුවත්, අරමුදලේ ආරම්භයේ සිටම කේවල ගිණුම පවත්වා නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 25 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) 7 (1) වගන්තිය | සියයට 8 ක් වූ දායක මුදල සියයට 12 ක් වූ රජයේ දායකත්වය භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගෙන් ගෙන්වා ගත යුතු වුවද, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මැයි 25 දිනැති අංක 4/2010 චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව අනිවාර්ය දායක මුදල හා රජයේ දායකත්වය යන දෙකම අදාල ආයතනවලින්ම ගෙන්වා ගැනීමට කටයුතු කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | සමාලෝචිත වර්ෂයේ නිකුත්කර මාස 06 ක කාලයක් ඉකුත් වී ඇතත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු.43,353 ක් වූ චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 486 | 2012 ඔක්තෝබර් 03 සිට 2013 සැප්තැම්බර් 03 දක්වා කාලය තුළ ලැබී අගරු වී තිබූ රු.150,565 ක වටිනා දායක මුදල් චෙක්පත් 10 සම්බන්ධයෙන් ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු.2,757,264,050 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,560,334,257 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.196,929,793 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සෑම මාසයකදීම අරමුදලට බැර කරනු ලබන මුදල් පිළිබඳ නිවේදනයක් ඊළඟ මාසයේ 15 දිනට පෙර අරමුදලේ ලේකම් වෙත අදාළ ආයතන විසින් එවිය යුතු වුවත් ,සමාලෝචිත වර්ෂයේදී සෑම මාසයක් සඳහා මෙම නිවේදන එවා තිබුණේ ආයතන කිහිපයකින් පමණක් වුවත් එම වාර්තා ගෙන්වා ගැනීමට කළමනාකාරිත්වය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේදී අරමුදල මගින් සාමාජිකයන්ට හිමිකර දි තිබූ පොළී ප්‍රතිශතයේ උච්චාවචනයක් සිදුවී තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාජිකයන්ට ගෙවූ පොළී ප්‍රතිශතය සියයට 0.29 කින් අඩුවී තිබුණි.

(ඇ) භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයක් මගින් අනුමත කර ඇති ආයෝජන මූලාශ්‍ර වන ස්ථාවර තැන්පතු , භාණ්ඩාගාර බැදුම්කර හා භාණ්ඩාගාර බිල්පත් යන ඒවායේ අපේක්ෂිත ප්‍රතිලාභ ඇගයීමෙන් අරමුදලට වාසිදායී ආයෝජන තීරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

**4.2 අරමුදලට අහිමි වී ඇති පොළී ආදායම**

------------------------------------

භාණ්ඩාගාර ලේකම් වෙතින් අයවිය යුතු රජයේ ප්‍රසාද මුදල අරමුදල වෙත නොලැබීම හේතුවෙන් එම මුදල් ආයෝජනය කිරීම මගින් උපයාගත හැකිව තිබුණු පොළී ආදායම් අහිමි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 7 ට අදාලව සියයට 11.95 ක සාමාන්‍ය පොළි අනුපාතය මත අහිමි වී ඇති පොළී ආදායම රු. 1,658,680,493 ක් විය.

**4.3 සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම**

--------------------------------

අරමුදලේ සමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත්‍ර අතුරින් අයදුම්පත් 2538 ක් සඳහා 2013 සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට ගෙවීම් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදි නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර තිබුණි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) අවකරණ ලේඛන
(ඇ) සාමාජිකයන්ගේ කේවල ගිණුම්.
(ඈ) ආයෝජනය
(ඉ) දායක මුදල්